**සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය - 2018**

**------------------------------------------------------**

සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එලඹි අංක 3585 - එස්ආර්අයි දරණ ණය ගිවිසුමේ 4.02 වගන්තියේ IV කොටස සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V(ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සළකන මාගේ අදහස් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්තිය උත්පාදනය වැඩිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,923.06 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 256.70 වන අතර ඉන් රු. මිලියන 31,104.84 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 200 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 8,818.22 ක් මූල්‍යනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූෂ්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ගිණුම්කරණ අඩුපාඩුව | මුදල<br>රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ඉඩම් කට්ටි අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද අත්තිකාරම් (ව්‍යවස්ථාපිත ගෙවීම්) කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගතකර තිබුණි. | 4.55 | කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් දැක්වීම සහ අනෙකුත් ණයගැතියෝ සමාන වූ ප්‍රමාණයකින් අඩුවෙන් දැක්වීම. | පිළිගත් අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ගිණුම් නිවැරදි කිරීමට අවශ්‍ය වේ. |

## 3. භෞතික ප්‍රගතිය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සුළං බලශක්ති උත්පාදන ධාරිතාව ඉහල නැංවීම, පද්ධති ප්‍රතික්‍රියාකාරී බල කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ ව්‍යාපාර ඉංජිනේරු සැලසුම් සමාලෝචනය හා අධීක්ෂණය සම්බන්ධව ණයගැණුම්කරුවන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීම යන අංග 03 ක් යටතේ ක්‍රියාත්මක වේ. ලද තොරතුරු වලට අනුව, සුළං බලශක්ති උත්පාදනය යටතේ කටයුතු 2013 දී ආරම්භ කර ඇති අතර එය ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අදාල කටයුතු ක්‍රියාත්මක කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශයට මාරුකර ඇති අතර 2017 දෙසැම්බර් 31 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු. මිලියන 307.86 ක මුදලක් ආයෝජනය කර ඇත. ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් 2018 ජුනි 31 වන විට ආරම්භ කිරීමට අපේක්ෂිත සුළං බලශක්ති උත්පාදන කටයුතු 2019 මාර්තු 25 දින ආරම්භ කර ඇත. ඒ අනුව ණයදීමේ නියෝජිතායතනය විසින් වෙන් කර ඇති මුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 32.25 කට සමානවූ රු. මිලියන 5,000 කින් සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙන් කරන ලද රු. මිලියන 239.63 කින් , ඇමරිකානු ඩොලර් මිලියන 13 කට සමාන වන රු. මිලියන 2,373 ක මුදලක් හා රු. මිලියන 482.64 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් භාවිතා කර තිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණයට සම්බන්ධ අඩුපාඩු

| කාර්ය මණ්ඩල තනතුර | අනුමත කළ කාර්ය මණ්ඩලය | 2018 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂක | 1 | 0 | 1 | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසිලෙස සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සිදුකල නොහැකි විය හැක. | පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීමක් කර තිබුණි. | සේවක අවශ්‍යතා නිසිලෙස හඳුනාගත යුතු අතර අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| විදුලි ඉංජිනේරු | 4 | 3 | 1 | | | |
| ගණකාධිකාරී | 1 | 0 | 1 | | | |
| විදුලි අධිකාරී | 8 | 3 | 5 | | | |
| සිවිල් අධිකාරී | 4 | 2 | 2 | | | |
| කාර්මික අධිකාරි | 3 | 1 | 2 | | | |

## 3.3 පද්ධති හා පාලනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 31 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ අවශ්‍යතා අනුව, ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. | ස්ථාවර වත්කම්වල භෞතිකව සත්‍යාපනය ක්‍රියාත්මක කල නොහැක. | 2019 දී වත්කම්වල භෞතික සත්‍යාපනය අවසන් කිරීමෙන් පසු ව්‍යාපෘතිය මඟින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන ලෙස පවත්වා ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V සී(31) වගන්තියට අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු වාර්තා කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර් ගිණුමක් පවත්වාගෙන ගොස් නොමැත. ව්‍යාපෘතිය විසින් වෙනම මුදල් පොත නඩත්තු කිරීම වෙනුවට ව්‍යාපෘති අංශයේ සාමාන්‍ය මුදල් පොතේම ලැබීම් සහ ගෙවීම් සටහන් කිරීම සඳහා භාවිතා කර තිබුණි. | ව්‍යාපෘතියේ මෙහෙයුම් හා සම්බන්ධ ගනුදෙනු පැහැදිලිව හඳුනාගත නොහැකි විය හැක. | මෙම ව්‍යාපෘතිය සඳහා වෙනමම වියපැහැදම් කිරීමේ බැංකු ගිණුමක් විවෘත කර නොමැති බැවින් එකී ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශයේ සාමාන්‍ය මුදල් පොතේ සටහන් කර ඇත. | ව්‍යාපෘතිය සඳහා වෙනමම ගිණුම් වාර්තා පවත්වා ගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 134(3) අවශ්‍යතා අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා | ව්‍යාපෘතිය මඟින් සිදු | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති කටයුතු අභ්‍යන්තර |

| | | | | |
|---|---|---|---|---|
| | විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනය කර නොතිබුණි. | කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව පාලනයන් දුර්වල වීම. | | විගණන අංශය විසින් විගණනයට භාජනය කල යුතුය. |
| (ඇ) | සේවකයින් වෙනුවෙන් උපයනවිට බදු (PAYE) රු. මිලියන 18.91 ක් ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබුණි. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ අදාල සේවකයින්ගේ වැටුපෙන් එය අඩුකිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ව්‍යාපෘතියේ පිරිවැය වැඩිවීම. | උපයනවිට බදු වගකීම මණ්ඩලය විසින්ම දරණු ලැබේ. | ලංකා විදුලිබල මණ්ඩලයෙන් ගෙවන ලද උපයන විට බදු (PAYE) අයකර ගත යුතුය. |
| (ඉ) | මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සෑම මූල්‍ය වර්ෂයකම මාර්තු 31 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 10 දින ඉදිරිපත් කර තිබුණි. | ප්‍රධාන අවශ්‍යතාවයක් සපුරා නොමැත. | සටහන් කර ඇති අතර නියමිත දිනට පෙර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කල යුතුය. |
| (ඊ) | මුදල් රෙගුලාසි 756 අනුව 2016 සිට වත්කම් වාර්ෂිකව භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වත්කම් භාවිතය සහ එහි පැවැත්ම සත්‍යාපනය කල නොහැක. | 2019 වර්ෂය සඳහා ව්‍යාපෘති කාර්යාලයේ සහ වැඩබිම් කාර්යාලයේ වත්කම් භෞතික සත්‍යාපනය කිරීමට දැනටමත් කටයුතු කර ඇත. | වත්කම් භෞතිකව සත්‍යාපනය කල යුතුය. |